**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2018**

**-------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව කොන්ත්‍රාත් අත්තිකාරම් ලේඛනය, කොන්ත්‍රාත් වැය රඳවා ගැනීම් ලේඛනය, කෙරීගෙන යන වැඩ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ලේඛන පිළියෙල කිරීමට තීරණය කර ඇත. | කොන්ත්‍රාත් පරිපාලනයට අදාළ මෙම ලේඛන නඩත්තු කර පවත්වාගෙන යා යුතු වේ. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ස්ථාවර වත්කම් | 94,355,913 | 76,116,899 | 18,239,014 | වෙනසට හේතුව ඉවත් කරන ලද වත්කම් ගිණුම් පොත් වලින් ඉවත් නොකිරීම වේ. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -රු. | | | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 16,500,578 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථන ලිපි ඉල්ලා යවා තිබුණද ලැබී නැත. | ශේෂ සනාථන ලිපි ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 5,040,775 | ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථන ලිපි ඉල්ලා යවා තිබුණද ලැබී නැත. | ශේෂ සනාථන ලිපි ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.16,500,578 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ශේෂවල එකතුව රු.14,881,063 ක්ද, වසර 1 සිට 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.615,776 ක්, වසර 2 සිට වසර 3 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.11,694 ක් සහ වසර 3 හා ඊට වැඩි පැරණි ණය ශේෂවල එකතුව රු.992,044 ක් වූ අතර, මෙම හිග ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම අයවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.5,040,775 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු රු.3,980,543 ක්ද වසර 1 සිට 2 දක්වා කාලයට අදාළව ශේෂවල එකතුව රු.750,225 ක්ද, වසර 3 ට වඩා වැඩි ණය ශේෂවල වටිනාකම රු.310,007 ක්ද විය. මෙම පැරණි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ශේෂවල නිරවද්‍යතාවය සොයා බලා නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ 7 උප වගන්තියේ (ඒ) සහ (බී) ඡේදය | මෙම වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ 2016 වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2016 වාර්තාවට කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් පනත ප්‍රකාරව මාස 03 ක් තුළ පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ iv වන කොටස (I) 82 (අ) වගන්තිය | ශිල්පීන්ගේ දැනුම වර්ධනය සඳහා විරල අමුද්‍රව්‍ය ආදේශනය සම්බන්ධයෙන් පර්යේෂණ හා නව නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,160,000 ක ප්‍රතිපාදන වෙන් කර පර්යේෂණ 03 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද, රු.536,000 ක් වැය කර රතු මැටි ආශ්‍රිත භාණ්ඩ වර්ණ ගැන්වීමේ කටයුතු පමණක් ඉටු කර තිබූ අතර, අනෙක් පර්යේෂණ 02 | මෙම කටයුතු විවිධ හේතූන් මත 2018 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලසුම් වල ඉලක්ක අදාළ වර්ෂය තුළ ලඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් කර නොතිබුණි. | | |
| (II) 82 (ආ) වගන්තිය | හස්ත කර්මාන්ත නිෂ්පාදන ප්‍රචලිත කිරීම සහ හස්ත කර්මාන්ත නිපැයුම් සඳහා දේශීය හා විදේශීය වෙළඳපල සංවර්ධනය යටතේ රු.10,400,000 ක ප්‍රතිපාදන වැයකර සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරකම් 07 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් අතරින් ක්‍රියාකාරකම් 05 සාර්ථකව ඉටු කර තිබූ අතර, ඉතිරි ක්‍රියාකාරකම් 02 ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වැය කර තිබුණද, එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණන අංශය වෙත ලිඛිතව ඉදිරිපත් නොකිරීම නිසා එම ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කරමි. | විගණනයට ඉල්ලුම්කරු ලිඛිත සාක්ෂි විගණන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (III) 82 (ඊ) වගන්තිය | අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිත සහතික නිකුත් කිරීමේ ක්‍රියාකාරකම 2018 දෙසැම්බර් 31 දින තෙක්ම ක්‍රියාවට නැංවීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි. | 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | සැලසුම් කළ පරිදි පනත මඟින් පැවරුණු කාර්යභාරය ඉටු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (I) මුදල් රෙගුලාසි 128 (1) (ආ) | ගෙවීම් කිරීමට පෙර අදාළ ලියවිලි පරීක්ෂා කර, නිර්දේශ කර අනුමත කර ගෙවීම් කළ යුතු වුවත්, එකතුව රු.17,047,940 ක ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන දෙවන බිල්පත්‍රයට ගෙවීම් කිරීමට ප්‍රථම ප්‍රමාණ බිල් පත්‍රය, මුළු සාරාංශ පත්‍රය සහ ප්‍රධාන සාරාංශ පත්‍ර එසේ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | එක් එක් සාරාංශ බිල් පත්‍ර සහතික කර නැත. මුළු වටිනාකම සහතික කළ යුතු විය. | බිල්පත් පරීක්ෂා කර අනුමැතිය සහිතව පමණක් ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12 යොමුවේ 5 වන වගන්තිය | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව වැට් බදු ගෙවීමේදී එකතුව රු.3,256,772 ක වැට් බදු ගෙවීම් පිළිබඳව විගණකාධිපතිවරයාට පිටපතක්ද සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම්දීමට පියවර ගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති පරිදි විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | මධ්‍යස්ථානයේ 2016 හා 2017 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2016 වාර්තාව රෙජීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර, 2017 වාර්තාවද ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,002,071 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,671,395 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,673,466 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායම් රු.9,651,005 කින් අඩු වීමත්, සමස්ථ මෙහෙයුම් වියදම් රු.1,891,533 කින් වැඩි වීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ මධ්‍යස්ථානය විසින් යුගයට නිමවුම් ප්‍රදර්ශනය සඳහා කැටලොග් 2,500 ක් එකතුව රු.235,000 ක් ගෙවා මුද්‍රණය කිරීමේදී එම කැටලොග් ප්‍රදර්ශනය අවසන් වීමට පෙර මුද්‍රණය කර භාර ගෙන ඒවා ශිල්පීන්, ආරාධිත අමුත්තන් සහ මහජනතාව අතර බෙදා හැරීමට කටයුතු නොකිරීම නිසා මෙම වියදම ආර්ථික නොවන වියදමක් බව නිරීක්ෂණය විය. | ඉතිරි කැටලොග් 2350 ක් ගබඩාවේ ඇති අතර ඒවා ඉදිරියේදී බෙදා දීමට නියමිතය. | කාර්යය නිමවූ පසුව කැටලොග් මුද්‍රණය කිරීම අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොහැකි වී ඇත. ඇණවුමක් ලබාදීම ප්‍රමාණවත් කාලයක් තිබියදී සිදු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනය හා කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ නව නිර්මාණ සහ හැකියා වර්ධන පුහුණු වැඩසටහන් සඳහා රු.2,700,000 ක ප්‍රතිපාදන භාවිතා කර ශිල්පීන් 477 දෙනෙකුට පුහුණුව ලබා දීමට සැලසුම් කර තිබුණද, එකතුව රු.1,500,000 ක් වැය කර ශිල්පීන් 256 දෙනෙකු වෙත පුහුණුව ලබා දීම නිසා මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 54 ක් විය. | ක්‍රියාත්මක අවස්ථාව වන විට වෙනත් මාර්ග වලින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ ප්‍රදේශවල පුහුණුව ලබාදීමට කටයුතු කර නොමැත. | පුහුණු වැඩසටහන් සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට විශාල කාලයක් ගතවීම නිසා ඉලක්ක තාත්වික වී නොමැත. ලඟා කරගත හැකි ඉලක්ක සැලසුම් කර කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) මධ්‍යස්ථානය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nation Development Program) ක්‍රියාත්මක කිරීමේදී මෙම වැඩසටහන සඳහා ලැබූ මුදල් ජංගම ගිණුමකට බැර කර තිබුණි. මෙම ජංගම ගිණුමේ ඉතිරි වූ මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු සහ මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එකතු වටිනාකම රු.5,731,750 ක් ආයතනයේ සේවකයින්ට දිරි දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇත. 2018 වර්ෂයෙන් පසුව දිරි දීමනා ගෙවීම නතර කර ඇත. | විධිමත් ඇගයීම් ක්‍රමවේදයන් සකස් කර මහාභාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන ගෙවීමට ක්‍රියා කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යස්ථානයේ වර්තමාන අධ්‍යක්ෂකවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා ලෙසද කටයුතු කර තිබූ අතර, 2019 මාර්තු 11 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදීද මාස 03 ක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවා ගැනීමට උපදෙස් ලබා දුන්නද එම උපදෙස් ප්‍රකාරව ලේකම්වරයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ලේකම් තනතුරට බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ව්‍යවසායක කාරක සභා නියෝග අනුව මාස 03 ක කාලයක් තුළ බඳවා ගැනීමට ක්‍රියා කර නොමැති අතර, එම උපදෙස් පරිදි කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති වියදම් නිවැරදිව පූර්ව සැලසුම් නොකිරීම හේතුවෙන් විදේශාධාර ව්‍යාපෘති 02 ක් වන Oxfam සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) වෙනුවෙන් ලැබී තිබූ අරමුදල් වලින් රු.17,508,753 ක සිට රු.11,835,233 ක් දක්වා පරාසයක වූ අරමුදල් සමාලෝචිත වර්ෂය මුළුල්ලේ බැංකු ජංගම ගිණුමක කිසිඳු ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | මේ පිළිබඳව පාලක මණ්ඩලයේ සාකච්ඡා කළ අතර එම මුදල් ඵලදායී කාර්යයක යෙදවීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන ලෙස උපදෙස් ලැබී ඇත. | වසර ගණනාවක සිට ජංගම ගිණුමක නිෂ්කාර්යාව ඇති මෙම මුදල් ඵලදායී කාර්යයක යෙදවීමට ක්‍රියා කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෑගල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල පුහුණුලාභීන් වෙත බෙදා දීම සඳහා එකතු වටිනාකම රු.335,272 ක් ගෙවා මිලදී ගෙන තිබූ මහන මැෂින් 08 ක් 2019 ජුනි 12 දිනය වන විටත් ඵලදායී කාර්යයකට යොදා නොගෙන වර්ෂයකට වැඩි කාලයක සිට මධ්‍යස්ථානයේ ගබඩා භාරයේ නිෂ්කාර්ය වත්කමක් ලෙස පැවතුණි. | මෙම මැෂින් 08 ගබඩා භාරකරු වෙත භාරදී ගබඩාව භාරයේ ඇත. | නිෂ්කාර්යා වත්කම් ලෙස පවතින මෙම මහන මැෂින් 08 පුහුණු ශිල්පීන් හඳුනාගෙන බෙදා හැරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට ඉල්ලීම් කිරීමට පෙර අස්ථිත්වය විසින් ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කළ යුතු වුවත්, එසේ ඉඩම් අත්කර ගැනීමකින් තොරව මධ්‍යස්ථානය විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.30,913,819 ක් ගෙවීම් කර තිබුණි | ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රථම ඉඩම් පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) උක්ත චක්‍රලේඛයේ කාර්ය සංග්‍රහයේ 4.2.3 වගන්තිය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම අවසන් වී සති 05 ක් ඇතුළත ප්‍රතිග්‍රහන ලිපිය (Letter of Acceptance) නිකුත් කළ යුතු වුවත්, මධ්‍යස්ථානය උක්ත කාර්ය සඳහා එම ලිපිය නිකුත් කිරීමට මාස 03 ක කාලයක් ගතකර තිබුණි. | ලංසු විශ්ලේෂණය කිරිමට සැලකිය යුතු කාලයක් ගත විම නිසා ප්‍රතිග්‍රහණ ලිපි නිකුත් කිරීමට මාස 03 ක පමණ කාලයක් ගතවිය. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) උක්ත චක්‍රලේඛයේ 8.9.1 (ආ) වගන්තිය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, මධ්‍යස්ථානය පෞද්ගලික ආයතනයකින් ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහන සඳහා එකතුව රු.12,056,576 ක් ගෙවා මහන මැෂින් 304 ක් මිලදී ගැනීමේදී ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබූ අතර, එම මහන මැෂින් ගබඩා ලේඛනගත කිරීමකින්ද තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2018 අප්‍රේල් සහ ජූනි මාස වලදී භාරදී තිබුණි. | මෙම මහන මැෂින් ඍජුව අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී ඇත. මේ පිළිබඳව ගිවිසුමකට එළඹී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) උක්ත දෙවන බිල්පත්‍රයට ගෙවීම් කිරිමේදී එකතුව රු.506,417 ක මිල විචලන වටිනාකමකට අදාළ මිල විචලන ලේඛනය උපදේශක ආයතන නිලධාරීන් විසින් පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම සහ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | උපදේශන ආයතනය මඟින් මේ පිළිබඳව විමසීම් කළ අතර ඔවුන්ගේ පිළිතුර වූයේ ගෙවීම් සහතික කිරීම තුළින් ඉතිරි ලේඛන සියල්ලම ඊට අදාළ උපකාරක ලේඛන වන බවය. | චක්‍රලේඛයන් ප්‍රකාරව සියළු ලේඛන, බිල්පත්‍ර පරීක්ෂා කර සහතික කිරීමෙන් පසුව ගෙවීම් කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 113 ක් වුවද, සත්‍ය කාර්ය මණ්ඩලය 84 ක් විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය සමඟ සත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී ද්විතීය හා තෘතීය මට්ටමේ කාර්ය මණ්ඩලවල 25 ක ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර, මෙම කාර්ය මණ්ඩල ඌනතාව අභ්‍යන්තර විගණන අංශ වැනි අංශ අක්‍රීය වීම කෙරෙහි හේතුවී තිබුණි. | වර්ෂය තුළ සේවකයින් විශ්‍රාම ගැන්වීම හා ඉල්ලා අස්වීම හේතුවෙන් පුරප්පාඩු රැසක් ඇති විය. මැතිවරණ හේතුවෙන් බඳවා ගැනීමේ කටයුතු තාවකාලිකව නතර කර තිබූ අතර, මෙම හේතූන් මත බඳවා ගැනීමේ කටයුතු වල සැලකිය යුතු ප්‍රමාදයක් සිදු විය. මේ වන විට සුදුසුකම්ලත් අය අයදුම්පත් කැඳවා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. | අනුමත තනතුරු සඳහා සුදුසු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශය සඳහා 2017 නොවැම්බර් මස නිලධාරියෙකු බඳවාගෙන තිබූ අතර, 2018 දෙසැම්බර් 07 දින එම නිලධාරියා සේවයෙන් ඉල්ලා අස්වී තිබුණි. එම අංශය සඳහා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර නොතිබූ අතර, අභ්‍යන්තර විගණක තනතුරට ස්ථිරව බඳවා ගන්නා තෙක් ආයතනයේ ගිණුම් නිලධාරී වැඩ බැලීමට 2019 ජනවාරි 21 දින සිට පත්කර තිබුණි. මෙම හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන කාර්යයක් ඉටු කර නොතිබුණි. | දැනට වැඩ බැලීමට නිලධාරියෙකු පත් කර ඇති අතර, ඉදිරියේදී බඳවා ගැනීමටත් මෙම අංශය සඳහා කළමනාකරණ සහකාරවරයෙකු බඳවා ගැනීමටත් කටයුතු කරමින් පවතී. | අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කළ යුතුය. |